# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1857/11 - 2014 අප්‍රේල් මස 09 වැනි බදාදා - 2014.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 26.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, වෙළෙන්දකු හෝ බෙදාහරින්නෙකු විසින් පහත සඳහන් සහල් වර්ග මළු/බහාලුම් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් පහත දක්වා ඇති උපරිම සිල්ලර මිලකට වැඩියෙන් සිල්ලර වෙළඳාම් කිරීම, සිල්ලර වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, සිල්ලර වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| | *උපරිම සිල්ලර මිළ (කිලෝ ග්‍රෑම් 1ක) රු. ශත* |
|---|---|
| සම්බා - ගල් වැලි ඉවත් කරන ලද සහ පිරිසිදු කරන ලද (කීරි සම්බා හා සුදුරු සම්බා හැර) | 77.00 |
| සුදු නාඩු | 68.00 |
| රතු නාඩු | 66.00 |
| සුදු කැකුළු | 66.00 |
| රතු කැකුළු | 60.00 |

සහල් මිල සම්බන්ධයෙන් 2009 මාර්තු මස 18 වැනි දින අංක 1593/28 දරන ලංකාණ්ඩුවේ *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 05 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රුමි මර්සුක්,
සභාපති.

2014 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

04-699


1A - PG 2029— 260 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*